ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

# 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

## 2021 වර්ෂය සඳහා භාණ්ඩ, කාර්ය, සේවා හා උපදේශක සේවා ප්‍රසම්පාදනය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පිළිගත් සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් හා උපදේශක සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ

**කාණ්ඩ අංකය**

**1. යන්ත්‍ර හා කාර්යාලීය උපකරණ ඉදිකිරීම් හා සවිකිරීම්**

- 1.1 වායුසමන යන්ත්‍ර
- 1.2 මොනපෝල් හා පයිලින් (Monopol / Pylon)

**2. මුද්‍රණ කටයුතු**

- 2.1 සියලුම වර්ගයේ ලිපි කවර
- 2.2 සියලුම වර්ගයේ ආකෘති පත්‍ර, රෙජිස්ට්‍රර් වර්ග හා පොත්පත්
- 2.3 සියලුම වර්ගයේ ප්‍රචාරක පත්‍රිකා
- 2.4 පාස් පොත් හා ප්ලාස්ටික් කවර
- 2.5 ආරක්ෂිත මුද්‍රණ කටයුතු (ස්ථිර තැන්පත් සහතික පත්‍ර හා ATM කාඩ්පත්)

**3. මිශ්‍ර**

- 3.1 සියලුම වර්ගයේ ලිපි ද්‍රව්‍ය
- 3.2 මුද්‍රණ කාට්‍රිජ් රිබන් හා ටෝනර්
- 3.3 පරිගණක ලිපි ද්‍රව්‍ය (Black light අත්සන් පත්‍රිකා, Pin Mailers සහ කාබනයිස් හා තර්මල් අඛණ්ඩ පත්‍රිකා)

**4. කොන්ත්‍රාත්**

- 4.1 ගොඩනැගිලි
- 4.2 ඇලුමිනියම් හා වැඩ නිමාවන්
- 4.3 ශාඛා අභ්‍යන්තර සැකසුම්

**5. උපදේශක සේවා**

- 5.1 විදුලි යාන්ත්‍රික ඉංජිනේරුමය සේවාවන් (වායුසමනය, විදුලි රැහැන් ඇදීම, විදුලි ජනක යන්ත්‍ර හා වෙනත්)

**6. උපදේශක නොවන සේවා (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)**

- 6.1 මෝටර් රථ වාහන අලුත්වැඩියාව
  - 6.1.2 යාන්ත්‍රික අලුත්වැඩියාව
  - 6.1.3 විදුලිමය අලුත්වැඩියාව
  - 6.1.4 ටින්කරින් හා ස්ප්‍රේ පේන්ටින්
- 6.2 වාහන නඩත්තු හා සේවා කිරීම්

**සැලකිය යුතුය :-**

ප්‍රාදේශීය වශයෙන් (කොළඹින් පිට ප්‍රදේශවල) භාණ්ඩ හා සේවා සැපයිය හැකි අයදුම්කරුවන් අදාළ පළාත් වශයෙන් විස්තර ඔවුන්ගේ අයදුම්පත්වල සඳහන් කළ යුතුය.

කොන්ත්‍රාත් සඳහා ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA/පෙර ICTAD හෝ ජාතික ඉදිකිරීම් ආයතනය NCASL) ඒ ඒ ක්ෂේත්‍රයට අදාළව වලංගු ලියාපදිංචිය ලබා තිබීම හා වලංගු ව්‍යාපාර ලියාපදිංචිය සමග එය අඛණ්ඩ ආසන්නම පෙර වසර තුන සඳහා තිබිය යුතුය.

උපදේශක සේවාවන් සඳහා අදාළ ආයතනයේ හෝ පුද්ගලයින්ගේ හෝ ඒ ඒ ක්ෂේත්‍රයේ වරලත් සාමාජිකත්වය සහිත පුද්ගලයින් සිටිය යුතු අතර, අදාළ නිපුණත්වය ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුවේ.

**කොන්දේසි හා නියමයන්**

**සියලුම අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය.**

01. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් විය යුතු අතර, ව්‍යාපාරික ලිපිනයේ දුරකථන, ෆැක්ස් සහ ඊමේල් පහසුකම් තිබීම වඩාත් යෝග්‍ය වේ.(ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

02. කොන්ත්‍රාත්කරුවන් සඳහා වලංගු CIDA හෝ NCASL ද ලියාපදිංචිය තිබිය යුතුය. (කලින් ICTAD ආයතනය)

03. අයදුම්කරුවන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, පිළිගත් පෞද්ගලික ව්‍යාපාරික ආයතන වලින් මෑත වර්ෂ වලදී මෙබඳු ඇණවුම් ලබා සතුටුදායක සැපයුම් හා සේවා නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි මගින් පෙන්නුම් කළ යුතුය.මෑත අවුරුදු 03 ක කාලයක් තුළ ලබා ඇති ඇණවුම් පිළිබඳ තොරතුරු සැපයීම වඩාත් සුදුසු වේ.

04. යන්ත්‍ර හා උපකරණ වැනි අලුත්වැඩියාවන් සහිත අයිතමයන් සැපයීමට බලාපොරොත්තු වන සැපයුම්කරුවන් අදාළ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අවස්ථාවලදී කර්මාන්තශාලා පහසුකම් තමන් සතු අය විය යුතුය.

05. අයදුම්කරුවන් රු.500,000/- ක් ඉක්මවන ඇණවුම් සැපයීමට බලාපොරොත්තු වන්නේ නම් ඊට අවශ්‍ය මූල්‍යමය හා අනෙකුත් සම්පත් ඇති බවට ලිඛිත සාධක පෙන්නුම් කළ යුතු අතර, පසුගිය වර්ෂ තුනෙහි (2017, 2018, 2019) විගණනය කරන ලද මූල්‍ය වාර්තාවල ඡායාස්ථ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් අපගේ www.rdb.lk **වෙබ් අඩවිය තුළින් බාගත කර** ගැනීමේ පහසුකම අයදුම්කරුවන් වෙත සලසා ඇත. හඳුන්වා දී ඇති මෙම ආකෘතිපත්‍රය මඟින් පමණක් අයදුම් කළ යුතු අතර, එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

07. එක් කාණ්ඩයක් යටතේ ඇති අනු කාණ්ඩ සඳහා එක් අයදුම්පතක් යටතේ අයදුම් කළ හැකි අතර, **සෑම ප්‍රධාන කාණ්ඩයක් සඳහාම ආපසු නොගෙවන රුපියල් 1,000.00 බැගින් (ප්‍රධාන කාණ්ඩ 06 සඳහා වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතුය) ලියාපදිංචි ගාස්තුවක් අයදුම්පත් භාර දීමේදී මුදලින් ගෙවිය යුතුය. සෑම අනු කාණ්ඩයක්ම පැහැදිලිව දැක්විය යුතුය**.

08. **සම්පූර්ණ කරන ලද අයදුම්පත්** 2021/01/05 **දින හෝ එදිනට පෙර අංශ ප්‍රධානී – මානව සම්පත් සංවර්ධන හා පරිපාලන, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ප්‍රධාන කාර්යාලය, නො. 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය**, වෙත හෝ මධ්‍යම, ඌව, සබරගමුව, නැගෙනහිර, වයඹ, උතුරු මැද, බස්නාහිර හා දකුණ යන පළාත් කාර්යාල වෙත ගෙනවිත් භාර දිය යුතුය.

09. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2021 සහ කාණ්ඩ අංකයන්** පැහැදිලිව සඳහන් කළ යුතුය.

10. අයදුම්කරුවන් වැට් සඳහා ලියාපදිංචි වී ඇත්නම් එම අංකය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු අතර, එසේ ලියාපදිංචි වී නොමැති නම් ඒ බැව් තහවුරු කොට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගෙන් ලබා ගත් ලිපියක් අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

11. ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, විගණිත මූල්‍ය වාර්තා (පසුගිය වසර තුනක), (අදාළ වේ නම්) මෙබඳු ඇනවුම් ලබා සතුටුදායක ලෙස සැපයුම් හා සේවා නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි (මිලදී ගැනීමේ ඇනවුම් හෝ කොන්ත්‍රාත් පිටපත්) පිටපත් අමුණා නොමැති අයදුම්පත් නැවත දැනුම්දීමක් නොමැතිව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්කරුවන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි නොකෙරෙනු ඇත.

12. රු.1000.00 ගෙවා අයදුම්පත් බැංකුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ලියාපදිංචි වූවා සේ නොසැලකේ.

13. කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හෝ කලත්‍රයා හෝ ඔවුන්ගේ දරුවන් අයදුම්කරු/ අයිතිකරුවන්/ හවුල්කරුවන් හෝ අධ්‍යක්ෂකවරුන් වන ආයතන සැපයුම්කරු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබයි.

14. එක් එක් අයදුම්පත් ඇගයීමට ලක් කරන අතර, බැංකුව තීරණය කරන පරිදි සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය බැංකුව සතු වේ.වැඩි විස්තර සඳහා කළමනාකරු – පරිපාලන වෙත **අංක 011 2035454** යන දුරකථන අංකයට අමතා ලබා ගත හැකිය.

**අංශ ප්‍රධානී -**

**මානව සම්පත් සංවර්ධන හා පරිපාලන,**
**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, නො. 933, නුවර පාර, වෙදමුල්ල , කැලණිය.**

**දුරකථන අංක : 011 2035470 /011 2035454**
**ෆැක්ස් : 011 2906883**